# <u>පටිච්චසමුප්පාදය - (පළමුකොටස)</u>
## <u>23. 03.2019 - ශ්‍රී ලංකාරාමය</u>
## <u>නවසීලන්තය</u>

සැම දෙනාටම යහපතක් වේවා! සැනසිල්ලක් වේවා! හොඳයි, දැන් මේ වේලාවේ අපිට තිබෙන්නේ ධර්ම සාකච්ඡාව. අද ධර්ම සාකච්ඡාවට අපි විශේෂ මාතෘකාවක් යොදාගෙන තිබෙනවා. පහුගිය කාලය තුල අපි ඉගෙන ගත්තා, යම් යම් දහම් කරුණු - ගාම්භීර සූත්‍ර දේශනාවල් - ඒ වාගේම අභිධර්ම කොටස් - චිත්ත ධර්ම චෛතසික ධර්ම - රූප කොටස් - නිර්වාණය පිළිබඳව එක එක පැහැදිලි කිරීම්.

අද අපි මේ පින්වතුන්ට කියලා දෙන්න බලාපොරොත්තු වෙන්නේ **පටිච්චසමුප්පාද ධර්මය.** ඒක බොහොම ගාම්භීර ධර්මයක්. ඒක නිසා පටිච්චසමුප්පාදය කියලා දෙන්න මේ කාලය අපි යොදාගන්නවා. ඉතිං මේ පටිච්චසමුප්පාදය බොහොම ගාම්භීර ධර්මයක්. ඒක සාමාන්‍ය කෙනෙකුට එහෙම කිව්වට තේරෙන්නෙත් නෑ. ඒකට උදව්වක් උපකාරයක් අවශ්‍යයි. කියලා දීමක් විස්තර කිරීමක් අවශ්‍යයයි. ඒක නිසා ඒ උදව්වෙන් උපකාරයෙන් ගාම්භීර ධර්ම උනත් තේරුම් ගන්න පුළුවන්. ඉතින් මේ වේලාවේ මේ කියලා දෙන පටිච්චසමුප්පාද විස්තරය, පටිච්චසමුප්පාද අංග, පටිච්චසමුප්පාද කාරණාවන් සියල්ලක්ම ඉතාමත් හොඳින් තේරුම් ගන්න අවබෝධ කරගන්න වටහාගන්න සැමදෙනාටම නුවණ පහළ වේවා! සිහිය අවදි වේවා! සිහියෙන් නුවණින් මේවා අසාගෙන මෙනෙහි කරමින් හොඳට මේ ධර්ම කාරණා දැනගන්න ලැබේවා! අවබෝධ කරගන්න ලැබේවා! එසේ අවබෝධ කරගෙන නිවනින් සැනසෙන්න ලැබේවා! කියලා ප්‍රර්ථනා කරනවා.

පටිච්චසමුප්පාදය කියන වචනයේ තේරුම හේතුවෙන් හටගන්න ධර්ම කියලා දෙන එකයි. මේ **'පටිච්ච'** කියන වචනයේ **'හේතු වෙන්' 'කාරණාවෙන්'** කියන අර්ථය තමයි තිබෙන්නේ. **'පටිච්ච'** කියන වචනය යම් යම් තැන් වල මේ විදියට විස්තර කරනවා.

**චක්ඛුඤ්ච පටිච්ච** = ඇස නිසා

**රූපෙ පටිච්ච** = රූපය නිසා

**චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං** = ඇස නිසා, රූපය නිසා චක්ඛු විඤ්ඤාණ උපදිනවා.

අපි සිංහලෙන් පාවිච්චි කරන වචනයක් තිබෙනවා 'ඒක නිසා' කියලා. ඒකට පාලියෙන් කියන්නේ **'තස්මා'** කියලා.

නමුත් මෙතැන **පටිච්ච** කියන එකේ අර්ථය **'නිසා'** කියන එකයි. **පටිච්චසමුප්පාදය** කියලා කියන්නේ **'යම්කිසි හේතුවක් නිසා හටගන්නා ධර්ම සවභාවයක්'** කියන එකයි.

- 'හේතුවක් නිසා හටගත්ත' ධර්ම වලට කියනවා 'පටිච්ච සමුපන්න ධර්ම' කියලා
- 'හේතුවක් වෙන ධර්ම' වලට කියනවා 'පටිච්චසමුප්පාද ධර්ම' කියලා.

මේක, හැම කෙනාටම ගාම්භීර ධර්ම කුරුණු ටිකක්. හොඳට තේරුම්ගන්න. මේක එකින් එකට හේතුවෙලා එකින් එකට ප්‍රත්‍යය වෙලා වැඩ කරන නිසා මේක උගන්වන කියලා දෙන විදියක් තිබෙනවා. ඒ විදියට කියලා දුන්නේ නැත්නම් තේරෙන්නේ නෑ. ඒක නිසා තමයි බුදුරජාණන්වහන්සේ පටිච්චසමුප්පාද පිළිවෙල එක්තරා රටාවකට කියලා දීලා තිබෙන්නේ.

පටිච්චසමුප්පාදයේ තිබෙනවා ක්‍රම දෙකක්. එකක් තමයි **අනුලෝම පටිච්චසමුප්පාදය** අනිත් එක තමයි **පටිලෝම පටිච්චසමුප්පාදය.**

- අනුලෝම පටිච්චසමුප්පාදය කියලා කියන්නේ ඇතිවීම කියලා දෙන එකට.
- පටිලෝම පටිච්චසමුප්පාදය කියලා කියන්නේ නැතිවීම කියලා දෙන එකට.

පටිච්චසමප්පාදයේ තිබෙනවා අංග 12 = අවිද්‍යාව - සංස්කාර - විඤ්ඤාණ - නාම රූප - සළායතතන - ඵස්ස - වේදනා - තණ්හා - උපාදාන - භව - ජාති - ජරා මරණ.

මේ අංග 12 වැඩීම් ක්‍රමය කියලා දෙනවා මෙහෙම.

- අවිජ්ජා පච්චයා සඞ්ඛාරා
- සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං
- විඤ්ඤාණ පච්චයා නාමරූපං
- නාමරූප පච්චයා සළායතනං
- සළායතන පච්චයා ඵස්සෝ
- ඵස්ස පච්චයා වේදනා
- වේදනා පච්චයා තණ්හා
- තණ්හා පච්චයා උපාදානං
- උපාදාන පච්චයා භවො
- භව පච්චයා ජාති
- ජාති පච්චයා ජරා මරණං කියලා මේ විදියට අනුලෝම වශයෙන් කියාගෙන යනවා. ඒ කියන්නේ අවිද්‍යාව නිසා සඞ්ඛාර - සඞ්ඛාර නිසා විඤ්ඤාණ - විඤ්ඤාණ නිසා නාමරූප - නාම රූප නිසා සළායතන - සළායතන නිසා ඵස්ස - ඵස්සය නිසා වේදනාව - වේදනාව නිසා තණ්හාව - තණ්හාව නිසා උපාදානය - උපාදානය නිසා භවය - භවය නිසා ජාතිය - ජාතිය නිසා ජරා මරණ සෝක පරිදේව ආදී දුක්ඛස්කන්ධය. මේකට කියනවා අනුලෝම ක්‍රමයේ පටිච්චසමුප්පාදය කියලා.

පටිලෝම ක්‍රමයට පටිච්චසමුප්පාදය කියලා කියන්නේ මේවා නැතිවෙන විදියට කියනවා **'අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, නාමරූපනිරොධා සළායතනනිරොධො, සළායතනනිරොධා ඵස්සනිරොධො, ඵස්සනිරොධා වෙදනානිරොධො, වෙදනානිරොධා තණ්හානිරොධො, තණ්හානිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සූපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති'**. මේක නැතිවීමේ ක්‍රමය.

පටිච්චසමුප්පාදය ඉගෙන ගන්න කැමතිනම් මේක පිළිවෙලකට ඉගෙන ගන්න.

අනුලෝම ක්‍රමයට කීයක් අංග තිබෙනවද? 12 ක් තිබෙනවා. ඒ දොළහ ගැන බුදුරාජාණන් වහන්සේ මෙහෙම කියලා දෙනවා. එකක් තමයි, **'අවිජ්ජා' 'සඞ්ඛාර' 'විඤ්ඤාණ'' 'නාමරූප' 'සළායතන' 'ඵස්ස' 'වේදනා' 'තණ්හා' 'උපාදාන' 'භව' 'ජාති' 'ජරා මරණ'** කියලා එක පිළිවෙලකට කියලා දෙන පටිච්චසමුප්පාද ක්‍රමයක් තිබෙනවා. මේ ක්‍රමය හරි ප්‍රසිද්ධයි. අපි සජ්ඣායනා කරනවා. පිරිත් පොතේ තිබෙනවා. මේ වචන වල අර්ථය නොතේරුණත් අපි මේ වචන නිතර කියනවා. කවුරුහරි ඇහුවොත් පටිච්චසමුප්පාදය දන්නවද කියලා ඔව් කියලත් කියනවා. නමුත් ඇත්තටම පටිච්චසමුප්පාදය දන්නවද? නෑ, වගන්ති ටික, පටිච්චසමුප්පාදයේ පද පේළි ටික දන්නවා. නමුත් පටිච්චසමුප්පාදය කියන්නේ මොකක්ද කියලා දන්නේ නෑ. නමුත් එහෙම නොවෙයි. පටිච්චසමුප්පාදය දැනගන්න ඇතුලට යන්න ඕනෑ. මේ විදියට බුදුරාජාණන්වහන්සේ **අවිද්‍යාව** මුල්කරගෙන 'ජාති ජරා' වශයෙන් කෙළවරවෙන පටිච්චසමුප්පාදයක් දේශනා කළා.

සමහර වෙලාවට තිබෙනවා මෙහෙම. 'ඵස්ස' 'වේදනා' 'තණ්හා' 'උපාදාන' 'භව' 'ජාති' 'ජරා මරණ' ආදී වශයෙන් මැදින් කඩලා ඉස්සරහට කියාගෙන යන එකක් තිබෙනවා. සමහර අවස්ථාවලදී මැදින් ආපස්සට එනවා.

උදාහරණයක් ලෙස අපි වේදනාවෙන් ගත්තොත් වේදනාවට හේතුව ඵස්සය - ඵස්සයට හේතු වෙන්නේ සළායතන - සළායතනයට හේතු වෙන්නේ නාමරූප - නාමරූප වලට හේතුවෙන්නේ

විඤ්ඤාණය - විඤ්ඤාණයට හේතු වෙන්නේ සංස්කාර - සංස්කාරයන්ට හේතු වෙන්නේ අවිද්‍යාව ආදී වශයෙන් පිටිපස්සට දේශනා කරන ක්‍රමයක් තිබෙනවා.

අනිත් ක්‍රමයට 'තණ්හා' 'උපාදාන' 'භව' 'ජාති' 'ජරා මරණ' ඔය විදියට කියාගෙන යනවා. මේ විදියට බුදුරාජාණන්වහන්සේ එක එක තැන් වලින් කඩලා වෙන් කරලා ඔය විදියට කියලා දෙන්න හේතුව මේක හරි අමාරු ගාම්භීර ධර්ම කාරණයක් නිසා. හැම එක්කෙනාටම හැම තැනින්ම මේක හසුවෙන්නේ නෑ. සමහර කෙනෙකුට **තණ්හාවෙන්** පටිච්චසමුප්පාදය කියලා දෙන්න පුළුවන්. සමහර කෙනෙකුට **වේදනාවෙන්** පටිච්චසමුප්පාදය කියලා දෙන්න පුළුවන්. සමහර කෙනෙකුට **උපාදානයෙන්** පටිච්චසමුප්පාදය කියලා දෙන්න පුළුවන්. සමහර කෙනෙකුට **ඵස්සයෙන්** සමහර කෙනෙකුට **සළායතන** වලින් පටිච්චසමුප්පාදය කියලා දෙන්න පුළුවන්. තථාගතයන් වහන්සේට තිබෙනවා විශේෂ දැනුමක් ඒ ඒ මිනිසුන්ගේ සත්වයන්ගේ දෙවියන්ගේ බ්‍රහ්මයන්ගේ මනස ගැන කියාගෙන හිතාගෙන උන්වහන්සේ scan කරගෙන යනකොට ඒ කෙනාගේ හිතේ දරන්න පුළුවන් ක්‍රමය, මෙයාට මේ ක්‍රමයයි ගැලපෙන්නේ කියලා තථාගතයන් වහන්සේට දැනෙනවා.

බෙහෙත් පෙති දෙනකොට තිබෙනවා සමහර බෙහෙත් පෙති පුංචියි. ඒකෙ ගන්න dose එකකුත් දාල තිබෙනවා, අවුරුදු 12 හෙන් පල්ලෙහා හෝ 12 වැඩියි නම් කියලා. ඒකෙ අවුරුදු 12 වැඩියෙන් නම් පෙති දෙකක් ගන්න කියලා තිබෙනවා නම් අවුරුදු 12 ට අඩුනම් එක පෙත්තයි ගන්න කියලා තිබෙන්නේ. තවත් පහළට ගියොත් පෙති භාගයයි. ඇයි එහෙම කරන්නේ? හේතුව, අර බෙහෙත් පෙත්ත ඇඟට වද්ද ගන්න දිරවා ගන්න ග්‍රහණය කරගන්න පුළුවන් ආකාරයට තමයි වෛද්‍යවරු ඒ බෙහෙත් ලියලා දෙන්නේ. ඉතිං ලොකු පෙති දෙකක් පොඩි එක්කෙනකුට දීපු ගමන් මොකද වෙන්නේ? මැරෙන්නත් පුළුවන්. හේතුව, ඒක අල්ලන්නේ නෑ. ඒවගේම ලොකු ඇඟක් තිබෙන කෙනෙකුට පෙති භාගයක් දුන්නට ඒක වැඩකරන්නේ නෑ. බුදුරාජාණන් වහන්සේට තමයි මේ ක්‍රමය තේරෙන්නේ, එක එක්කෙනාට දෙන්න ඕනෑ dose එක මොකක්ද කියල. ඒ ක්‍රමයට තමයි තථාගතයන් වහන්සේ ඔය ධර්ම දේශනාවල් කරලා තිබෙන්නේ.

අපි ලොකු පොතක් අරගෙන කියෙව්වට අපිට ඕක තේරෙන්නේ නෑ. ඒක නිසා මෙකේ තිබෙනවා කියලා දෙන ක්‍රමයක්. ඒක නිසා එක පාරම මේක දාන්න බෑ. එක පාරම මේක කියලා දෙන්න බෑ. බලමු අද කොච්චර ප්‍රමාණයකට මේ පින්වතුන්ට මේක වැටහෙනවද කියලා.

මේක හරි ගාම්භීර ධර්මයක්. බුදුරාජාණන් වහන්සේ පටිච්චසමුප්පාදය දේශනා කරන්නේ මෙන්න මේ විදියටයි. අවිද්‍යාව ගැන කියලා තිබෙන්නේ **දුක්ඛෙ අඤ්ඤාණං - දුක්ඛසමුදයෙ අඤ්ඤාණං - දුක්ඛ නිරෝධෙ අඤ්ඤාණං -දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං** කියලා.

මේකේ පළවෙනි අංගය තමයි **අවිද්‍යාව.** ඉස්සෙල්ලා තේරුම් ගන්න ඕනෑ අවිද්‍යාව කියන්නේ මොකක්ද කියලා. නොදැනීම කියලා කියනවා. නොදැනීම නොවැටහීම කියලා කිච්චහම නොදන්නා කම් තිබෙනවා හතරක්.

1. **දුක්ඛෙ අඤ්ඤාණං** = දුක කියන්නා වූ දේ දන්නේ නෑ. ඒක නිසා කියනවා අවිද්‍යාව කියලා.
2. **දුක්ඛසමුදයෙ අඤ්ඤාණං** = දුක හටගන්නා ක්‍රමය පිළිවෙල දන්නෙත් නෑ.
3. **දුක්ඛ නිරෝධෙ අඤ්ඤාණං** = දුක නැති උනාට පස්සේ පවතින්නාවූ ශාන්ත ස්වභාවය නිරෝධය දන්නෙත් නෑ.
4. **දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං** = ඒ නිරෝධයට පත්වෙන ක්‍රමය නැත්නම් පිළිවෙත දන්නෙත් නෑ. මේකට කියනවා අවිද්‍යාව කියලා.

ඤාණය කියලා කියන්නේ අවබෝධ කරගන්නවා කියලා කියන එක.

**ඤාණං** = විශේෂ දැනීම

දැන් නැත්තේ මොකක්ද? අවබෝධ කරගන්න ගතිය නෑ.

ඒක නිසා කියනවා **අඤ්ඤාණං** කියල = අ + ඤාණං

මේ **අඤ්ඤාණං** කියන පදය හැදිලා තිබෙන විදියත් දැනගන්න.

**අ + ඤාණං**

මෙහි **'අ'** කියන එක උපසර්ගයක්. **'ඤ'** කියන එක **ව්‍යඤ්ජන** අක්ෂරයක්. **ඤාණං** කියන වචනය පටන් අරගෙන තිබෙන්නේ **'අ' 'උ' 'ඉ' 'එ' 'ඕ'** යන අකුරු වලින් නොවෙයි. ඒවාට කියනවා ස්වර කියලා. (අ -ආ - ඉ - ඊ - උ - ඌ - එ - ඔ = පාලි භාෂාවේ ස්වර) **ඤාණ** කියන වචනය පටන් ගෙන තිබෙන්නේ ස්වරයකින් නොවෙයි. එය පටන් අරගෙන තිබෙන්නේ ව්‍යඤ්ජන අක්ෂරයකින්. ස්වර නොවන්නාවූ අනිත් අකුරු වලට කියනවා **ව්‍යඤ්ජන** කියලා. ව්‍යඤ්ජන අක්ෂරයකට මුලින් යෙදිය හැක්කේ **'අ'** අකුරයි. නමුත් **'අ'** කියන වචනය **'ඤ'** වැනි ව්‍යඤ්ජනකට කලින් තිබුණහම ඒකට තවත් **'ඤ'** වැනි අක්ෂරයක් තිබිය යුතුයි. ඒක තමයි නීතිය. ඒක නිසා එය මෙසේ ලිවිය විය යුතුයි = **'අඤ්ඤාණං'.**

ඒවගේම තිබෙනවා ප්‍රමාද කියලා වචනයක් = සිහිය නැති කම.

සිහිය තිබෙනවා කියලා කියන කොට වෙන්නේ = **අ - පමාද**. නමුත් **'පමාද'** කියන වචනය පටන්ගෙන තිබෙන්නේ ව්‍යඤ්ජන අක්ෂරයකින්. ඒක නිසා **අ - පමාද** කියලා තියන්න බෑ. ඒක නිසා තව **'ප'** යන්නක් එතනට එකතු කරන්න ඕනෑ. එතකොට තමයි **අප්පමාද** වෙන්නේ.

**(අප් - පමාද = අප්පමාද)**

දැන් අපි කථා කරන්නේ **අඤ්ඤාණං** කියන වචනය ගැන. අඤ්ඤාණං කියලා කියන්නේ අවිද්‍යාව - නොදැනීම නොවැටහීම - අනවබෝධය. මොනවා ගැනද අවබෝධය නැත්තේ? දුක දන්නේ නෑ. සමුදය දන්නේ නෑ. නිරෝධය දන්නේ නෑ. මාර්ගය දන්නේ නෑ.

**දුක්ඛය** කියන්නේ මොකක්ද? සංසාරයේ දිගින් දිගටම යෑමට තිබෙන එකට කියනවා දුක කියලා. ඒක දන්නේ නැති ඒකට කියනවා **අඤ්ඤාණං** කියලා.

**ඉපදීම** කියන එක දන්නේ නැති එකට කියනවා **අඤ්ඤාණං** කියලා.

**ජරාව** කියන එක දන්නේ නැති එකට කියනවා **අඤ්ඤාණං** කියලා.

**දුක්ඛ** කියල කියන **ජාති - ජරා - ව්‍යාධි - මරණ - සෝක - පරිදේව - දුක්ඛ - දෝමනස්ස - උපායාස - විප්පයෝග - සම්පයෝග - උපාදාන ස්කන්ධ** යන සියල්ල පිළිබඳ නොදැනීමට කියනවා අවිද්‍යාව කියලා = **දුක්ඛෙ අඤ්ඤාණං**. මේ ඔක්කොම ටික එක වචනයක් තුල ගැබ් කරලා දේශනා කළා.

මේ දුක පිළිබඳ අපි දන්නේ නෑ. මේ දුක ඇතිවෙන්නේ කොහොමද කියලා අපි දන්නේ නෑ. ඒකට කිව්වා **දුක්ඛසමුදයෙ අඤ්ඤාණං** කියලා. ඒකත් අවිද්‍යාව. මේ ටික නැතිවෙච්ච තැන ජරාවක් නැති තැන ව්‍යාධියක් මරණයක් නැති ඇඬීමක් නැති සෝක පරිදේව නැති ඇඟක් නැති උපාදාන ස්කන්ධයක් නැති තැන කොච්චර ශාන්තද කියලා අපි දන්නේ නෑ. ඒවගේ තැනක් තිබෙනවා කියලා දන්නෙත් නෑ එතැනට යන පාර දන්නෙත් නෑ. ඒකට කියනවා **දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං** කියලා. නිවන් කියලා එකක් තිබෙනවා කියලා දන්නෙත් නෑ. නිවීම දන්නෙත් නෑ. මේ දැවි දැවී තිබෙන දුක්ඛ ස්කන්ධය දන්නෙත් නෑ. දුක් උපදින විදිය දන්නෙත් නෑ. මේ range එකේම අවබෝධයක් නැති එකට කියනවා **අවිද්‍යාව** කියලා. ඒක නිසා බුදුරාජාණන්වහන්සේ දේශනා කරනවා **දුක්ඛෙ අඤ්ඤාණං - දුක්ඛසමුදයෙ අඤ්ඤාණං - දුක්ඛනිරොධෙ අඤ්ඤාණං - දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං** කියලා. දැන් හතරක් කිව්වා. මේ විදියට දේශනා කළේ චතුරාර්ය සත්‍යය වශයෙන්.

ඊළඟට තවත් විදියක් තිබෙනවා. අපි මේ මනුස්ස ජීවිතිය එක ලක්ෂයක් (point) කියලා ගත්තොත් අපි මීට පෙර ජීවත්වෙලා හිටපු තැන් අපි දන්නේ නෑ. ඉස්සර හිටපු තැන මේ ශරීරය උසට තිබුණද, අපිට තිබුණේ කකුල් හතරක ස්කන්ධයක්ද, කකුල් දෙකක් තිබුණ ස්කන්ධයක්ද, තටු දෙකක් තිබුණ

ස්කන්ධයක්ද, තටු නැතුව නිකම්ම නිකම් බඩ ගගා යන ස්කන්ධයක්ද තිබුණේ කියලා මොකක්වත් අපි දන්නේ නෑ. ඒකාලේ මොනවාද කැවේ කියලා දන්නේ නෑ. මොන පරිසරයකද හිටියේ, ගුහාවකද හිටියේ, ගෙදරකද හිටියේ, අත්තකද හිටියේ කියලා අපි දන්නේ නෑ. ඒ විඳපු දුක් මොකක්වත් දන්නේ නෑ. ඒකට කියනවා **පුබ්බන්තෙ අඤ්ඤාණං** කියලා. ඒ කියන්නේ මීට කලින් වෙච්ච දේ දන්නේ නෑ.

ඊළඟට **අපරන්තෙ අඤ්ඤාණං** - මීට පස්සේ මගේ ජීවිතය කොට එකක් වෙයිද, උස එකක් වෙයිද, ගහක ඉන්න එකක් වෙයිද, තටු තිබෙන එකක් වෙයිද, උඩින් යන්න පුළුවන් එකක් වෙයිද, කකුල් හතරේ එකක් වෙයිද කියලා අපි මොකක්වත් දන්නේ නෑ. ඒකට කියනවා **අපරන්තෙ අඤ්ඤාණං** කියලා.

**පුබ්බන්තෙ අඤ්ඤාණං - අපරන්තෙ අඤ්ඤාණං** - මේ දෙකටම කියනවා **අවිද්‍යාව** කියලා.

ඊළඟට ඒ දෙකම අරගෙන ඒ දෙපැත්තම දන්නේ නැති එකට කියනවා **පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං** කියලා.

අනිත් එක තමයි **පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං = පටිච්චසමුප්පාද ධර්මය** ගැන දන්නේ නෑ.

**අවිද්‍යාව** කියලා කියන්නේ මේවා දැන ගන්න බැරි කම. දැන් අපිට පෙර භවයක් තිබුණද? තිබුණා. අපි ඒ ගැන දන්නවද? දන්නේ නෑ. අනාගතයක් තිබෙනවද? තිබෙනවා. අපි දන්නවද? නෑ. පටිච්චසමුප්පාදයක් තිබෙනවද? තිබෙනවා. නමුත් අපි ඒ ගැන දන්නේ නෑ. දුකක් තිබෙනවාද? තිබෙනවා. නැත්තේ මොකක්ද? ඒ ගැන දන්න ගතිය නෑ. සමුදයක් තිබෙනවා, නමුත් ඒ ගැන දන්නේ නෑ. ඒක නිසා මේ සියල්ලම තිබෙනවා, දුකක් තිබෙනවා, සමුදයක් තිබෙනවා, මාර්ගයකුත් තිබෙනවා. ඒ තිබෙන දේවල් දැන ගන්න ඉඩ දෙන්නේ නැති, ඒ තිබෙන දේවල් හඳුනා ගන්න ඉඩ දෙන්නේ නැති, ඒ තිබෙන දේවල් දැන ගන්න එක වහලා තිබෙන, ඒ දැන ගන්නා ගතියට පත්වෙන්න නොදෙන, යම් කිසි චිත්ත ගතියක්, චිත්ත ධර්මයක්, හිතේ තිබෙන්නාවූ එක්තරා විදියක ගතියක් හින්දා තමයි ඕක අපිට තේරෙන්නේ නැත්තේ. ඕක අපිට දැනෙන්නේ නැත්තේ. ඕක අපිට වැටහෙන්නේ නැත්තේ. ඒ ගතියෙන් කරන්නේ ඒ ධර්ම වල තිබෙන reality එක තත්වාකාරය හිතට දැනෙන්නේ නැති වෙන්න, නුවණට දැනෙන්නේ නැති වෙන්න වහලා වහලා තිබෙනවා.

ඔය හැම එක්කෙනාගේම සිත්වල තිබෙනවා එක ගුණ විශේෂයක්, එක ධර්ම විශේෂයක්. ඒකට කියනවා **අවිද්‍යාව** කියලා. ඒ අවිද්‍යාවෙන් කරන්නේ මේ හැම එක්කෙනාගේම ඇඟ අතුල දැන ගන්න දෙන්නේ නෑ, cover කරනවා. හැම එක්කෙනාගේම ඇස මොකක්ද කියලා දැන ගන්න දෙන්නේ නෑ, cover කරනවා වහනවා. මේ හැම එක්කෙනාගේම කටින් කථා කරන වචනය මොකක්ද කියලා දැන ගන්න දෙන්නේ නෑ, ඒකෙ අවබෝධය වහනවා. ඒකෙ විපාකය මොකක්ද කියලා දැන ගන්න දෙන්නේ නෑ, වහනවා. කයින් කරන වැඩ කරන පිළිබඳව අවබෝධයක් දැනුමක් වැටහීමක් හදලා දෙන්න දෙන්නේ නෑ, වහලා තිබෙන්නේ. ඇඟ ඇතුලේ තිබෙන ලෙඩ ගැන වැටහීමක් නෑ. තව කොච්චර ජීවත් වෙන්න වෙයිද, ඒගැන කළකිරීමක් හදලා දෙන්නේ නෑ. මේ ශරීරයේ යථා ස්වභාවය, හිතේ යථා ස්වභාවය, වේදනාවේ ස්වභාවය දැන ගන්න දෙන්නේ නැති, ඒවා වහලා තිබෙන ගතියක් ඔය හැම එක්කෙනාගේම සිත්වල තිබෙනවා. මෙතැන ඉන්න හැම එක්කෙනාගේම සිත්වල තිබෙනවා මේ ධර්ම දැක ගන්න බැරි ඒ ධර්ම දැකීම වහගන්න ගතියක්. ඒ ධර්මයට කියනවා **අවිද්‍යාව** කියලා.

තවත් ඒ **අවිද්‍යාව** වැඩ කරන හැටියට නම් දීලා තිබෙනවා. ඒකට **මෝහය** කියලත් කියනවා. **අවිද්‍යාව** කියලත් කියනවා. **අඤ්ඤාණ** කියලත් කියනවා. **අදස්සන** කියලත් කියනවා. **අප්පටිවේද** කියලත් කියනවා. **සම්මොහ** කියල කියනවා. **අසම්පජඤ්ඤ** කියලත් කියනවා. ඔය වගේ නම් 25 විතර තිබෙනවා. ඒ හැම වචනයකින්ම කියන්නේ **අවිද්‍යාව** කියන එක.

එතකොට දැන් බලන්න හැම එක්කෙනාගේම හිත්වල තිබෙනවා අවිද්‍යාව, මේ board ඒකෙ තිබෙන අවිද්‍යාව නොවෙයි. මේ හැම එක්කෙනාටම දුක තේරෙන්නේ නැත්තේ ඇයි? මේ හැම එක්කෙනාගේම සිත්වල තිබෙනවා ඒ ගතිය වසන, වසන් කරන, හංගලා තිබෙන ගතියක්. ඒක තේරෙන්න දෙන්නේ නෑ. එළියට ඇවිල්ල අවබෝධ වෙන්න දෙන්නේ නෑ. ඒක පිළිබඳව දර්ශනයක් හැදෙන්න ඉඩ දෙන්නේ නෑ. මේක කවුරුවත් කරපු එකක් නොවෙයි. මේ හැම එක්කෙනාගේම සිත්වල තිබෙනවා තමන්ගේ ඇඟ ගැන, තමන්ගේ වේදනාව ගැන, මේකේ අස්සේ තිබෙන්නාවූ සකලමනාවන් ගැන, මීට පස්සේ වෙන්නාවූ දේවල් ගැන, මීට ඉස්සෙල්ලා වෙච්ච දේවල් ගැන අංශු මාත්‍රයක්වත් තේරුම් ගන්න දෙන්නේ නැති වහලා දාන ගතියක්, ධර්ම ස්වභාවයක්.

ඒක දකුණු උරහිසේ නොවෙයි තිබෙන්නේ. ඒක තිබෙන්නේ හිතේ. ආන්න ඒ සිතට කා වැදිලා සිතේ අංගයක් වෙලා, සිතේ ගතියක් වෙලා පවතින්නාවූ ඔන්න ඔය ගතිය නිසා තමයි අපිට තේරෙන්නේ නැත්තේ. මේ ඇඟ, මේ හුස්ම රැල්ල, හුස්ම රැල්ලේ තිබෙන ලක්ෂණ වැටහෙන්නේ නැත්තේ, ඒක තේරුම් කරගන්න පුළුවන් ගතිය වහනවා. ඒ වසන ගතියට කියනවා **අවිද්‍යාව** කියලා.

දැන් කෙනෙකුගේ අතක් කසනවා. එතකොට ඒ කෙනාගේ ඇඟිලි ටික ගිහිල්ලා එතන හූරනවා. ඒ හූරන එකට කියනවා 'අත කසනවා' කියලා. අත කසනකොට එතැන දැනෙනවා යම්කිසි සනීපයක්. ඒ සනීපය යනු කුමක්ද කියලා තේරුම් ගන්න අර අවිද්‍යාව ඉඩ දෙන්නේ නෑ. ඒ අත කසනවා කියන ක්‍රියාවට ඇඟිලි ටික ගිහිල්ලා චිත්තකිරිය වායෝ ධාතුවෙන් විඤ්ඤත්තියක් ගිහිල්ලා හිත මෙහෙයවලා රූප සමූහයක් අත පැත්තට ඇදිලා ගිහිල්ලා සිද්ධියක් වෙනවා කියන එක ගැන අවබෝධ මාත්‍රයක් ලබා දෙන්න ඉඩ දෙන්නේ නෑ. ඒ ක්‍රියාවෙන් පස්සේ සිද්ධ වෙන දේ ගැන තේරුම් කරගන්න අවබෝධයක් ලබාගන්න ඉඩ දෙන්නේ නෑ. ඒක නිසා හැම තිස්සෙම ඒ අවබෝධය වහලා තිබෙන්නේ. ඒක කාගේ ගාවද තිබෙන්නේ? එක එක්කෙනාගේ සිත් වල තිබෙන්නේ, තම තමන් ගාව තිබෙන්නේ.

**අවිද්‍යාව** කියලා කියන එක හැම කෙනාගේම 'ජීවිත අර්ථය ලබා නොදෙන' අර්ථයෙන් එක හා සමානයි. මගේ අවිද්‍යාව අනිත් එක්කෙනාගේ අවිද්‍යාවට වඩා වෙනස් ස්වරූපයක් තිබෙන්නේ කියලා හිතුවට හරි යන්නේ නෑ. අවිද්‍යාවේ තිබෙන්නේ මුලා වෙච්ච ලක්ෂණය. අවිද්‍යාව හැම වේලාවේම කරන්නේ සිතුවිල්ලක් පහළ වෙනකොටම වහනවා. අවබෝධය ලබා දෙන්නේ නෑ.

දැන් මේ **ජාතිය ජරාව මරණය** කොහෙද තිබෙන්නේ? **ජාතිය** එනම් ඉපදෙන ලක්ෂණය, ඉපදෙන ගතිය තිබෙන්නේ තමා ගාව. **ජරාව** තිබෙන්නේත් තමාගාව. උදේ ඉඳලම දිරා යනවා. නමුත් එතැනම තිබෙන හිත දන්නේ නෑ දිරනවා කියලා. ඊළඟට **මරණයත්** එතැනම තිබෙනවා. අපි අනිත් අයගේ මරණ ගැන අඬනවා වැලපෙනවා තමා ළඟ තිබෙන මරණය ගැන හිතන්නේ නැහැ. හැම වේලාවේම අවිද්‍යාවෙන් කරන්නේ ඒක වහනවා. අඬන්න වෙනවා වැළපෙන්න වෙනවා නමුත් ඒකට හේතුවෙන ඒවා වහලා දානවා. ඒ ගතියට කියනවා අවිද්‍යාව කියලා. ඒක නිසා හිසේ පටන් පාදාන්තය දක්වාම - ඒකට කියන්නේ **සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා** කියලා. කෙටියෙන් කියන්නේ නම් ස්කන්ධ පහම දුකයි කියන එකයි.

හිසේ පටන් පාදාන්තය දක්වා ඇතුළතද, වමේ ඉඳන් දකුණටද, දකුණේ ඉඳන් වමටද, උඩ ඉඳන් පහළටද. පහළ ඉඳන් උඩටද. මධ්‍යයේ ඉඳලා හතර වටේටම සහ **හිත** යන කිසිම දෙයක් ගැන අපි හරියාකාරව දන්නේ නැති හින්දා ඒකට කියනවා **අවිද්‍යාව** කියලා.

මේ ශරීරයත් අපිට නැත්නම්, කවදාකවත් නැවත මේක පහළ වෙන්නේ නැති තත්වයකට එනම් නැත්තටම නැති වෙලා ගියානම්, මෙහෙවත් බ්‍රහමලෝකයේවත් දිව්‍යලෝකයෙවත් කොහෙවත් රූප හැදෙන්නේ නැතුව නැත්තටම නැතිවෙලා ගියා නම්, ආයේ කවදාකවත් හිතක් හටගන්නේ නැතුව නැත්තම නැතිවෙලා ගියහම තිබෙන ඒ ධර්මතාවයත් අපි දන්නේ නෑ. ඒකට කියනවා **අවිද්‍යාව** කියලා. ඔක කාගේ ගාවද තිබෙන්නේ? තමන් ගාව.

ඊළඟට මේ අවිද්‍යාව නිසා මේ කියන්නා වූ නොවැටහීම නොදන්නා කම නිසා අඥාන භාවය නිසා එතන තව එකතුකරගන්න, රැස් කරගන්න, යම් කිසි දෙයක් register කර ගන්න ධර්මයක් තිබෙනවා.

ඒ කියන්නේ අපේ හිතේ තිබෙනවා මොකක් හරි දෙයක්, අනාගතයකට නැකම් කියාගෙන අනාගතයේ කොහේ හරි තැනකට පුපුරුවා හරින්ට - අනාගතයේ කොහේ හරි තැනක නැවත දෙයක් ඒ හේතුවෙන් ඇති කරන්න පුළුවන් එකතුවක් ශක්තියක් බලයක්. ඒ හටගැනීම සිදුවෙන්නේ අර අවිද්‍යාව නිසයි. බැටරියක් charge කරනකොට ඒකෙන් කරන්නේ අනාගතයේදී ඒ electricity හේතුවෙන් මොකක් හරි දෙයක් ඇතිවෙන්න බලයක් එකතු කිරීමක්.

ඒවගේම අනාගතයට දික්ගස්සන, ළඟ හෝ දුර හෝ අනාගතයේ කොහේ හෝ තැනක තව හිතුවිල්ලක් තව අදහසක් තව ශරීරයක් තව මොකක් හරි දෙයක් ඇති කරන්න, නිෂ්පාදනය කරන්න පුළුවන් රැස් කිරීමක් සිද්ධ වෙනවා අපේ හිතේ. මේ රැස් කිරීමට එකතු කිරීමට විශේෂයෙන්ම හේතුවෙන ළඟම හේතු කාරකයා තමයි අර කිව්වා වූ නොදන්නා ගතිය, **අවිද්‍යාව.** අවිද්‍යාව නිසා තමයි ඒ රැස් කිරීම වෙන්නේ. අපි දන්නේ නෑ, එහෙම එකක් අපේ ගාව තිබෙනවද කියලා. අපි කියනවා 'අපේ හිතේ එක්කාසු කරන රැස් කරන ගතියක් තිබෙනවා' කියලා නමුත් අපි ඒ ගැන දන්නේ නෑ. ඇයි එහෙම දන්නේ නැත්තේ? **අවිද්‍යාව නිසා.** අවිද්‍යාව, එහෙම එකක් තිබෙනවා කියලවත් දැනගන්න දෙන්නේ නෑ. බුදුරාජාණන්වහන්සේ තමයි ඒක සොයාගෙන අපිට දේශනා කළේ. ඒ රැස් කරන ගතියට කියනවා **සංස්කාර ගතිය** කියලා. ඒ එක්කාසු කරන ගතිය. යමක් රැස් කළොත් තමයි පසුව පරිභෝග කරන්න පුළුවන් වෙන්නේ. එක විදියකට ඒ රැස් කිරීම් වර්ග තුනකට කියනවා.

1. **පුඤ්ඤාභිසංඛාර**
2. **අපුඤ්ඤාභිසංඛාර**
3. **ආනෙඤ්ජාභි සංඛාර**

මේ තුනම හැදෙන්නේ අවිද්‍යාව හේතු කරගෙනයි.

කුසල කර්මයන්ට, පිං කම් වලට කියනවා **පුඤ්ඤාභිසංඛාර** කියලා. හිතේ තිබෙන පරිසරය පිරිසිදු කරන අර්ථයෙන් පිං කියලා කියනවා. අනිත් අකුසල ධර්මයන්ට සාපේක්ෂව මේක හොඳයි. මේ පුඤ්ඤාභිසංඛාර හැදුවත් අනාගතයේදී අනාගතයේ ඒකෙන් විපාක ලැබෙනවා. මේ පුඤ්ඤාභිසංඛාර අවිද්‍යාවෙන් හැදුනත් එතැන ගිනි ගන්න ගතිය නෑ. ටිකක් cool down වෙලා තිබෙනවා. ඒක අනාගතයේදී විපාක දෙනකොටත් හොඳයි. දැන් ගින්දරයි අයිසුයි ගත්තහම වෙනසක් තිබෙනවා. අයිස්වල තිබෙන්නේ සීතල ගතියක්. ගින්දර වල තිබෙන්නේ රස්නේ ගතියක්. ඒවගේ පිං වල තිබෙනවා යම්කිසි නිවිච්ච සන්සුන් ගතියක්. නමුත් ඒවා විපාකයෙන් මිදිලා නෑ. ඒවාට කියනවා **පුඤ්ඤාභිසංඛාර** කියලා.

- **අපුඤ්ඤාභිසංඛාර** කියලා කියන්නේ අකුසල.
- **ආනෙඤ්ජාභි** සංඛාර මම මේ විදියට කියලා දෙන්නම්. අභිධර්ම විස්තරයේදී අපි ඉගෙන ගත්තා චිත්ත - චෛතසික - රූප - නිබ්බාන කියලා ධර්ම කාණ්ඩ 4ක්.

ඔක්කොම සිත් කීයක් තිබෙනවාද? 89 යි. අපි චෛතසික ධර්ම 52 ක් ඉගෙන ගත්තා. රූප ධර්ම 28 ඉගෙන ගත්තා. නිර්වාණය ඉගෙන ගත්තා. කීයක් තිබෙනවාද ඔක්කොම ධර්ම? 170 යි. (කෙටි ක්‍රමයට)

මේ සිත් 89 තුල

- කාමාවචර කුසල් සිත් 8 තිබෙනවා.
- රූපාවචර කුසල් සිත් 5 තිබෙනවා
- අරූපාවචර කුසල් සිත 4 තිබෙනෙවා.
- ලෝකෝත්තර කුසල් සිත් 4 තිබෙනවා. නමුත් මේවාට සංස්කාර ලක්ෂණය නෑ. ඒවාට එකතු කිරීමක් කරන්න බෑ.

කාමාවචර **කුසල් සිත්** 8 ක් තිබෙනවා. කාමාවචර **විපාක සිත් 8** තිබෙනවා. කාමාවචර **ක්‍රියා සිත් 8** ක් තිබෙනවා. ඒ විපාක සිත් වලින් තව දෙයක් උපදවන්නේ නෑ. ඒක නිසා ඒවා විපාක මිසක කුසල් නොවෙයි. ක්‍රියා සිත් වලිනුත් ඉස්සරහට යමක් උපදවන්නේ නෑ. ඒවා ක්‍රියා මාත්‍ර පමණයි. ඒක නිසා කුසල් සිත් 8 පමණයි ගන්නේ.

රූපාවචර සිත් වලත් තිබෙනවා කුසල් සිත් විපාක සිත් සහ ක්‍රියා සිත් 15ක්. නමුත් කුසල් සිත් 5 හට පමණයි ඉස්සරහට යමක් කරන්න පුළුවන් කමක් තිබෙන්නේ.

අරූපාවචර සිත් වලත් තිබෙනවා කුසල් සිත් විපාක සිත් ක්‍රියා සිත් ඔක්කොම 12ක් . නමුත් කුසල් සිත් 4ට පමණයි ඉස්සරහට යමක් හදලා දෙන්න පුළුවන්. මේ වෙනස තේරුම් ගන්න.

සිත් 89 ක් තිබුණාට සිත් 89 යෙන්ම විපාක උපදවන්න බෑ. ඒ සිත් 89 යෙන් කුසල ශක්තිය තිබෙන ඒවාට පමණයි විපාක හදලා දෙන්න පුළුවන්කම තිබෙන්නේ. මේ අපි කථා කරන්නේ කුසල පැත්ත පමණයි.

කාමාවචර කුසල් සිත් 8 + රූපාවචර කුසල් සිත් 5 + අරූපාවචර කුසල් සිත් 4 + ලෝකෝත්තර කුසල් සිත් 4 යන සිත් අතුරින් ලෝකෝත්තර කුසල් සිත් 4 අනාගතයේ භව විපාක හදන්නේ නෑ. අනාගතයේ කොහේවත් උපදවා දෙන්නේ නෑ. ඒක නිසා ඒ ලෝකෝත්තර සිත් 4 සංස්කාර ගොඩින් අයින් කරනවා. එතකොට ඉතිරිවන්නේ සිත් 17 යි.

මෙයින් කාමාවචර කුසල් සිත් 8 **+** රූපාවචර කුසල් සිත් 5 **=** පුඤ්ඤාභිසංඛාර (සිත් 13)

සිත් 89 යෙන් පුඤ්ඤාභිසංඛාර වලට අයිතිවෙන්නේ සිත් 13යි. මේ සිත් 13 ට පුළුවන් හොඳ තැනක උපදවන්න. හොඳ තැනක ජීවිතියක් හදලා දෙන්න. නමුත් සංසාරික වශයෙන් බැලුවහම මේ ජීවිතියයි ඒ හදලා දෙන ජීවිතියයි දෙකම දුකයි. මේ කුසල් සිත් වලට තිබෙනවා අමුතු හැකියාවක්. අමුතු බලයක්. අමුතු ශක්තියක් තිබෙනවා මෙතැන මේවා පහළ උනහම මොකක් හරි හේතුවක් නිසා අනාගතයට ඒකෙ ඇදියක් දික්ගැස්සීමක් තිබෙනවා. ඒ ඉස්සරහට ලැබෙන දේට කියනවා විපාකය කියලා. ඉස්සරහට විපාකයක් හැදෙන්න දැනට ඇතිවෙන එක්කාසුවට කියනවා සංස්කාරය කියලා. ඒක නිසා මේ සිත් 13ට කියනවා **පුඤ්ඤාභිසංඛාර** කියලා. ධ්‍යාන වඩන කොට දාන මාන පිංකම් කරනකොට **පුඤ්ඤාභිසංඛාර** පහළ වෙනවා.

ඊළඟට සත්තු මරණකොට හොරකම් කරකොට අධම්තේට්ටම් කරනකොට මේ සිත් 13 පාවිච්චි කරන්න බෑ. මේවා කුසල් සිත්. ඒවාට පාවිච්චියට ගන්න වෙනම සිත් ටිකක් තිබෙනවා. ඒවා තමයි අකුසල සිත්.

| | | |
|---|---|---|
| එහි ලෝභ සිත් මූල 8 ක් තිබෙනවා. | | |
| ද්වේශ මූල සිත් 2 ක් තිබෙනවා. | } | අපුඤ්ඤාභිසංඛාර = (සිත් 12) |
| මෝහ මූල සිත් 2ක් තිබෙනවා. | | |

**පුඤ්ඤාභිසංඛාර** සහ **අපුඤ්ඤාභිසංඛාර** යන සිත් 25 තුල අනාගතයේදී යම්කිසි ඵලයක් මතුකරලා දෙන ගතියක් තිබෙනවා.

ඊළඟ තිබෙනවා **අරූපාවචර කුසල් සිත්** 4ක්. ඒවාට කියනවා **ආනෙඤ්ජාභි සංඛාර** කියලා. **'ආනෙඤ්ජ'** කියලා කියන්නේ අනිත් ආරම්මණ වලින් **'සෙලවෙන්නේ නෑ'** කියන එකයි.

කාමාවචර කුසල් සිත් 8 + අකුසල් සිත් 12 + රූපාවචර සිත් 5 + අරූපාවචර 4 = සිත් 29 ට කියනවා **අවිජ්ජාපච්චයා සංඛාරා** කියලා. මේ සිත් පහළ වෙන්නේ අවිද්‍යාව පදනම් වෙලා. මේ විදියට මේ සිත් 29 යට කියනවා **සංස්කාර ධර්ම** කියලා. මේ සෑම එකකම තිබෙනවා එකතු කරන ගතිය.

මෙහි වර්ග තුනක් තිබෙනවා. සිත්13 ගොඩින් එකතු කර ගත්තොත් එක විදියක්. 12 ගොඩින් එකතුකර ගත්තොත් එක විදියක්. 4 ගොඩෙන් එකතුකර ගත්තොත් තව විදියක්. ඒක නිසා මේ සිත්වල එකතු

කිරීම් වර්ග තුනක් තිබෙනවා. මේ එකතු වීම් වලට විශේෂයෙන්ම හේතුවෙන්නේ නොදන්නාකම. අපි හැම වේලාවේම අනාගතයට මොකක් හරි කොක්කක් ඇතිවෙන විදියට තමයි වැඩ කරන්නේ.

දැන් මේ කිච්චේ ඇතුලත තිබෙන්නාවූ සිත් වශයෙන්, හොඳට මතක තබා ගන්න. **අවිජ්ජා පච්චයා** සංඛාරා කියලා කිව්වහම **පුඤ්ඤාභිසංඛාර, අපුඤ්ඤාභිසංඛාර, ආනෙඤ්ජාභි සංඛාර**. ඔය විදියට සිත් පහළ වෙනවා 29 ක්. මේ සිත් 29 එක හා සමාන වෙන්නේ නෑ. මේ රැස් කරන රැස් වීම් වලින් අපි යන්නේ පැති තුනකටයි. මේ සිත්, ඵල නිෂ්පාදනය කරන්න පුළුවන් හයිය තිබෙන සිත්. මේ සිත් 29 යට කියනවා සංස්කාර කියලා. මේ කිච්චේ අතුලත තිබෙන්නා වූ සිත් වශයෙන්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ආනෙඤ්ජාභි සිත් නොසෙල්වෙන සිත් කියලා කිව්වේ ඇයි?

<u>පිළිතුර</u> - ඒකෙ මෙන්න මෙහෙම එකක් තිබෙනවා. **එඤ්ජති** කියලා වචනයක් තිබෙනවා. **එඤ්ජති** කියලා කියන්නේ සෙලවෙනවා කම්පනය වෙනවා කියන එකයි. මේ **එඤ්ජති** කියන වචනය පටන් අරගෙන තිබෙන්නේ ස්වරයෙන්. ස්වරයකින් පටන් ගන්න වචන වලට දාන කැලියි ව්‍යඤ්ජනවලින් පටන් ගන්න වචන වලට දාන කැලියි වෙනම පැකට් තිබෙනවා භාෂාවේ. ඒකට අදාළ එකක් තමයි මෙතනට දාන්න ඕනෑ. මේ **එඤ්ජති** කියන වචනය ඉස්සරහට තවත් ස්වරයක් දාන්න බෑ.
(උදා. අ + එඤ්ජති) කියලා ලියන්න බෑ. ඒක නිසා එතැනට **'අන්'** කියන වචනය දන්න ඕනෑ.

(අන් + එඤ්ජති ) = ආනෙඤ්ජාභි (නොසෙල්වෙන)

'නේ '

(ඇත්තටම මෙතනට එන්න ඕන 'ඉ' අකුර. මම මේ පින්වතුන්ට මේ වෙලාවට වැටහෙන්නයි මෙහෙම කියලා දුන්නේ)

තව තිබෙනවා මෙන්න මෙහෙම. **කාය සංඛාර - වචී සංඛාර - චිත්ත සංඛාර**. මේවා නම් කරලා තිබෙන්නේ සංස්කාර නිෂ්පාදනය වෙන තැන අනුව. **කාය සංඛාර** කියලා කියන්නේ කයින් සිද්ධ වෙන්නාවූ ක්‍රියා. **වචී සංඛාර** කියලා කියන්නේ වචනයෙන් සිද්ධ වෙන ක්‍රියා. **චිත්ත සංඛාර** කියලා කියන්නේ සිතින් පහළ වෙන අදහස්. මෙහි වර්ග තුනක් තිබෙනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස දැන් ඔය කාය මනෝ චිත්ත කියලා කිව්වට ඔය තුනම එකතු වෙලා නේද හැම තිස්සෙම .......? අර පඨවි අපෝ තේජෝ කියලා ගත්තහම එකට නේද ඒවා වැඩෙන්නේ ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - ඒ රූප සම්බන්ධයෙන්. මේවා නාම ධර්ම.

දැන් අපි ඉගෙන ගත්තා **පුඤ්ඤාභිසංඛාර - අපුඤ්ඤාභිසංඛාර - ආනෙඤ්ජාභි සංඛාර** කියලා සිත් 29 ගැන . එයින් පුඤ්ඤාභිසංඛාර යටතේ සිත් 13 තිබෙනවා.

**පුඤ්ඤාභිසංඛාර** = සිත් 13 (කාමාවචර සිත් 8 + රූපාවචර 5) මේවා සියල්ලම කුසල සිත්. මනුස්සයෙන් පිං කමක් සිද්ධ කරනවා. ඒ පිංකම සිද්ධ කරන්නේ කථා කරන්නේ නැතුව. අපි හිතමු එයා කථා කරන්නේ නැතුව සේනාසනයක් අතු පතු ගානවා කියලා. එතකොට කුසල් සිත් පහළ වෙනවා. ඔහු සේනාසනය අතු පතු ගාන්නේ කයින්. ඔහු වන්දනා කරනවා, ඒත් කයින්. කයින් අතුපතු ගානකොට වන්දනා කරනකොට ඇප උපස්ථාන කරනකොට මේ සිත් පහළ වෙනවා. මේ සිත් ඇතුලේ පහළ උනාට ඒවා විකාශනය වෙන්නේ කය හරහා. ඒක නිසා මේ සිත් 13 **කාය සංඛාර** වෙනවා.

**පුඤ්ඤාභිසංඛාර** = කාමාවචර සිත් 8 + රූපාවචර 5 = කාය සංඛාර (මේ සිත් 13 පුඤ්ඤාභි සංඛාරත් වෙනවා කාය සංඛාරත් වෙනවා. කයින් කරපු නිසා කාය සංඛාර වෙනවා. පිං සිතුවලින් කරපු නිසා පුඤ්ඤාභි සංඛාර වෙනවා).

**පුඤ්ඤාභිසංඛාර** = කාමාවචර සිත් 8 + රූපාවචර 5 = **වචී සංඛාර** (කෙනෙක් මේ සිත් වලින් බණ දේශනා කරනවා. ගාථා කියනවා. සූත්‍ර සජ්ඣායනා කරනවා. ඒවා කරන්නේ වචනයෙන්. ඒක නිසා ඒවාට කියනවා **වචී සංඛාර** කියලා. මේ අවස්ථාවේදී මේ සංඛාර පුඤ්ඤාභිසංඛාරත් වෙනවා වචී සංඛාරත් වෙනවා).

**පුඤ්ඤාභිසංඛාර** = කාමාවචර සිත් 8 + රූපාවචර 5 = **චිත්ත සංඛාර** ( කෙනෙක් අතුගාන්නෙත් නෑ. ධර්මය දේශනා කරන්නෙත් නෑ. එයා භාවනා කරනවා. එතකොටත් මේ සිත් 13 පහළ වෙනවා චිත්තය අරමුණු කරගෙන. ඒක නිසා ඒවාට කියනවා **චිත්ත සංඛාර** කියලා. ඒක නිසා මේ සිත් පුඤ්ඤාභිසංඛාරත් වෙනවා චිත්ත සංඛාරත් වෙනවා)

මේ සංඛාර වලට 'කාය සංඛාර' 'වචී සංඛාර' 'චිත්ත සංඛාර' කියලා නම් දාල තිබෙන්නේ ඒවා නිෂ්පාදනය වෙන දොරටුව අනුවයි.

යම් කිසි දෙයක් නිෂ්පාදනය කරනකොට ඒ නිෂ්පාදන ඒවා නිෂ්පාදනය කරන ආයතනයේ නමිනුත් යනවා. නිෂ්පාදනවල ගුණාත්මක ස්වාභාවයෙනුත් යනවා. උදා: දැන් තලගුලි කියලා කිව්වහම ජිනදාස තලගුලි කියලා කියනවා. ඒ තලගුලි වලට නම වැටිලා තිබෙන්නේ ජිනදාස තලගුලි කියලා. ඒකට නම වැටුනේ ජිනදාස නම් වූ කෙනෙක් හදපු නිසා. ඒක නිසා කියනවා ජිනදාස තලගුලි කියලා. එතකොට ඒවා මොනවාද? ඒවා තලගුලි. ජිනදාස හදපු නිසා ජිනදාස තලගුලි උනා. අහලා තිබෙනවද මෝනිස් බිස්කට් කියලා තිබෙනවා. ඒ බිස්කට් හදන්නෙත් අනිත් බිස්කට් වගේ පිටි මිශ්‍රණයකින්. නමුත් ඒ බිස්කට් තිබෙන්නේ ඒවා නිෂ්පාදනය කරන ආයතනයේ නමින්. ඒ බිස්කට් ඒකෙ පිටිත් තිබෙනවා, මෝනිස් ගතියත් තිබෙනවා.

ඒවගේ මේ **පුඤ්ඤාභිසංඛාර** කයින් හදපු නිසා නිෂ්පාදන ආයතනයේ නමින් **කාය සංඛාර** උනා. මේ **පුඤ්ඤාභිසංඛාරම** වචනයෙන් හදපු නිසා නිෂ්පාදන ආයතනයේ නමින් **වචී සංඛාර** උනා. මේ **පුඤ්ඤාභිසංඛාරම** සිතින් හදපු නිසා නිෂ්පාදන ආයතනයේ නමින් ඒවාට කියනවා **චිත්ත සංඛාර** කියලා.

**අපුඤ්ඤාභිසංඛාර** තිබෙනවා 12 = (ලෝභ මූල සිත් 8 + ද්වේශ මූල සිත් 2 + මෝහ මූල සිත් 2)

කෙනෙක් කිසි කථාවක් නැතුව යම්කිසි දෙයක් හොරකම් කරගෙන යනවා. ඒක කරන්නේ කයෙන්. ඒ වේලාවට සකස් වෙන සංඛාර නිෂ්පාදනය කරන ආයතනය නමින් **කාය සංඛාරත්** වෙනවා **අපුඤ්ඤාභිසංඛාරත්** වෙනවා.

කෙනෙක් තව කෙනෙකුට බණිනවා දොස් කියනවා. ඒ අවස්ථාවේදී සංඛාර නිෂ්පාදනය කරන ආයතනය නමින් ඒවා **වචී සංඛාර** වෙනවා. ඒ ක්‍රියාවට හිත මෙහෙයවන්නේ අපුඤ්ඤාභිසංඛාර වලින් නිසා ඒවා **අපුඤ්ඤාභිසංඛාරත්** වෙනවා.

ඊළඟට කෙනෙක් කාට හරි වැරදි දෙයක් කරන්න හිත හිතා ඉන්නවා. මෙලෙස හිත හිත ඉන්නකොට සංඛාර නිෂ්පාදනය කරන ආයතනය නමින් ඒවා **චිත්ත සංඛාරත්** වෙනවා. ඒවා **අපුඤ්ඤාභිසංඛාරත්** වෙනවා.

'කාය සංඛාර' 'වචී සංඛාර' 'චිත්ත සංඛාර' පුඤ්ඤාභිසංඛාරද වෙනවා අපුඤ්ඤාභිසංඛාරද වෙනවා. නමුත් ආනෙඤ්ජාභි සංඛාර - චිත්ත සංඛාර පමණයි.

පුඤ්ඤාභිසංඛාර }
- කාය සංඛාර
- වචී සංඛාර
- චිත්ත සංඛාර

| | | |
|---|---|---|
| අපුඤ්ඤාභිසංඛාර | } | කාය සංඛාර<br>වචී සංඛාර<br>චිත්ත සංඛාර |
| *ආනෙඤ්ජාභි සංඛාර | } | චිත්ත සංඛාර |

*අරූපාවචර ධ්‍යාන වැඩීම කාය සංඛාර වලින් හෝ වචී සංඛාර වලින් කරන්න බෑ.

මේ හැම තැනකදීම් පෙන්නුම් කළේ අනාගතයට යම් කිසි විපාකයක් ලබා දීම පිණිස එකතු කිරීමක්. රැස් කිරීමක්. මේ එකතු කිරීම් ක්‍රම තිබෙනවා 29ක්. ඒ 29 තමයි අපි බෙදුවේ පුඤ්ඤාභිසංඛාර = (13) අපුඤ්ඤාභිසංඛාර = (12) සහ ආනෙඤ්ජාභි සංඛාර = (4) වශයෙන්. මේවායෙන් තමයි රැස් වෙන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස නිස්සරණ අධ්‍යාශය කියලා වචනයක් අපි පාවිච්චි කරනවා, මොනවා හරි කරන කොට කිසි දෙයක් බලාපොරොත්තු නොවී කරනවා කියලා. එතකොට ඒක පුඤ්ඤාභිසංඛාර වලට අයිති වෙනවද?

<u>ස්වාමීන්වහන්සේ</u> - ඔව්. නිස්සරණ අධ්‍යාශය කියන එක සාමාන්‍ය සමාජ භාවිතයයි ඒකෙ ගැඹුරු අර්ථයයි දෙකක්. අර උද්දච්චය වගේ. අපි කියනවා ඔය මනුස්සයා හරි උද්දච්ච මනුස්සයෙක් කියලා කියනවා. ඇත්තටම උද්දච්චය කියලා කියන්නේ හිත විසිරෙනවා කියන එකයි. නමුත් අපි උද්දච්ච මනුස්සයා කියලා අදහස් කරන්නේ උඩඟු කෙනා කියන එකයි. නිස්සරණ අධ්‍යාශය කියන එකත් ඔය වගේ එකක්. නිස්සරණය කියලා කියන්නේ නිවනට නමක්. නියම නිස්සරණ ගතිය තිබෙන්නේ නිවනේ. ඒකෙ ගැඹුරු අර්ථය තමයි ලෝකයට සම්බන්ධ කිසිම දෙයක් බලාපොරොත්තු නොවී නිස්සරණ අධ්‍යාශයෙන් යමක් කරනවා කියලා කියන්නේ නිවන් අරමුණු කරගෙන කෙලෙස් මිශ්‍ර කරගන්නේ නැතුව යම් කිසි දෙයක් කිරීම.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස සමහර තැන්වල වචීසංඛාර විතක්ක විචාර කියලා තේරුම් ගත්තොත් එතකොට රැස් කරන එකක් වෙන්න බැහැ නේද?

<u>පිළිතුර</u> - මෙහෙමයි ජිනදාස තල ගුලියි ජිනසේන වතුර මෝටරෙයි දෙකක්. ඇත්තටම විතක්ක විචාර අවශ්‍යයි කාය සංඛාර එහෙම හදන්න. ඒවා මූල ධර්ම හැටියට තිබෙනවා. මේ කියන්නේ දොරටුව.

<u>ප්‍රශ්නය</u> - විතක්ක විචාර කියන කොට ඒවත් රැස් කිරීමේ අර්ථයෙන් ගන්න පුළුවන්ද?

<u>පිළිතුර</u> - විතක්ක විචාර දෙකෙන් කරන්නේ මෙහෙය වීම. අපිට වචනයක් කථා කරන්න බෑ විතක්ක විචාර දෙක නැතුව. ඒ දෙන්න ඉස්සරහට පැනල එහෙට මෙහෙට හොල්ලලා හදන්න ඕනෑ. සද්ද ගස්සන්න ඕනෑ. විතක්ක විචාර දෙක නැතුව වචනයක් කථා කරවන්න බෑ, ඇඟ ක්‍රියාත්මක කරවන්න බෑ. ඒක නිසා මෙහෙය වීමේ අර්ථයෙන් තමයි එතැන විතක්ක විචාර දෙක වචී සංඛාර හැටියට කථා කරන්නේ. මෙතැන එහෙම නොවෙයි. මේ අපුඤ්ඤාභිසංඛාර පුඤ්ඤාභිසංඛාර ආනෙඤ්ජාභි සංඛාර කියන්නේ රැස් කිරීමේ අර්ථයෙන්. මේ එක වචනය නිසා පටලැවෙන ගතියක් තිබෙනවා.

දැන් දාන චේතනාව පුඤ්ඤාභිසංඛාරද? අපුඤ්ඤාභිසංඛාරද? පුඤ්ඤාභිසංඛාරයි. සීලයත් පුඤ්ඤාභිසංඛාර.

ප්‍රශ්නය - ස්වාමීන්වහන්ස භාවනාවක් වැරදියට කරනකොට ඒක අයිති වෙන්නේ මොකටද? චිත්ත සංඛාර වලටද?

පිළිතුර - ඒවා අපුඤ්ඤාභිසංඛාර. ඒවා චිත්ත සංඛාර වලට ගැනෙනවා.

අනිත් එක තමයි මේ කරුණු ටික මතක තබා ගන්න. අපි දන්නේ නෑ චිත්ත සංඛාරය කියන්නේ මොකක්ද? කාය සංඛාරය කියන්නේ මොකක්ද? වචී සංඛාරය මොකක්ද? ඒවා රැස් වෙන විදිය, ඒවා කොච්චරක් ඉස්සරහට යනවද කියලා ඒ ගැන කිසිම දැනීමක් තේරුමක් අපිට නැති නිසා තමයි අපි ඒ ඒ දේම කරන්නේ. ඒකට හේතුව නොදන්නා කමයි. නොවැටහීමයි. අවිද්‍යාවයි.

ඊළඟට අපි මේ නම දිග්ගස්සන්න බලනවා. අපි හොඳ තැනක උපදීවා කියලා අපි යම් කිසි තැනක් හොයාගෙන එතැනට අපිව ඇදගෙන යන විදියකට අපි මෙතැන රැස් කරවනවා. ඒ එකතු කිරීමක්. අපිට අවශ්‍යය කරන ස්වභාව තිබෙනවා. ලස්සන ශරීරයක්, ලස්සන ඇස් දෙකක්, ලස්සන කන් දෙකක්, ලස්සන කට හඬක්, ප්‍රණීත කෑම බීම, ආහාර පාන සුවඳ විලවුන්, මල් මාලා ආදී ගොඩක් දේ අපි හිතා ගන්නවා. හිතාගෙන ඒවා ලබා ගැනීමට මෙතැන රැස් කරනවා. ඒ රැස් කිරීම කාය සංඛාර වෙන්න පුළුවන් වචී සංඛාර වෙන්න පුළුවන් චිත්ත සංඛාර වෙන්න පුළුවන්. ඔය විදියට අපි දික්ගස්සනවා. ඒ දික් ගස්සන්නේ කුමක් නිසාද? අවිද්‍යාව නිසා. ඒ දික්ගස්සන වැඩ වලට යොමු වෙන්නේ රැස් කරන්නේ එකතු කරන්නේ ඒ නිසයි.

තරුණ කාලයේදී ගැහැණු ළමයි පිරිමි ළමයි අවුරුදු 18, 19, 20, 21 වගේ වෙනකොට ඔය ගොල්ලෝ එක්කාසු කරගෙන මල් අරගෙන හඳුන් කූරු අරගෙන පැන් අරගෙන බෝධීන් වහන්සේලා වටේ කරකව කරකව වැඳ වැඳ බෝධි පූජා පවත්වලා ඥාණ පූජා පවත්වලා හිඟනන්ට රුපියලක් දෙකක් හරි දහයක් හරි දීලා ඒවා එහෙම කර කර සංඛාර උපදවනවා. උපදවලා උපදවලා උපදවලා පිරිත් පොත ඔක්කොමත් කියනවා. එහෙම කියලා පැතීමකුත් කරනවා. මේ පුතාට දුවට ඉතා ඉක්මනින් විවාහයක් හොඳ කෙනෙක් හම්බවේවා කියලා ප්‍රාර්ථනා කරනවා. අපිටත් එහෙම කොළ ඇවිල්ලා තිබෙනවා. අපිත් එහෙම කියලා තිබෙනවා.

එහෙම බෝධිය වටේ කරකැවිලා බෝධි පූජා කරලා කවුරුහරි එක්කෙනක් හොයා ගන්නවා. හොයාගෙන ඊට පස්සේ ළමයෙක් එහෙම හම්බ වෙලා අවුරුදු පහක් දහයක් ගියාට පස්සේ ආයිත් යනවා අර බෝධිය ගාවට. ඊට පස්සේ ආයිමත් වතුර වක්කරලා මල් පූජා කරලා මේවගේ එක්කෙනෙක් නම් ආයේ ජාති ජාති හම්බ නොවේවා කියලා ප්‍රාර්ථනා කරනවා. එහෙම තමයි. එකම බෝධිය ගාවට යනවා. ගිහිල්ලා අර විදියට සංඛාර උත්පාදනය කරනවා. එයා ලබා ගන්න යන්නෙත් එතැනට. අත්හරින්න යන්නෙත් එතැනට. අන්න ඒවගේ තමයි. නොදන්නා කම නිසා එයාමයි කාය සංඛාර හැදුවේ. එයාමයි වචී සංඛාර හැදුවේ. එයාමයි චිත්ත සංඛාර හැදුවේ. සංඛාර හදලා හදලා හදලා ඉක්මනට එක්කෙනෙක් හොයා ගන්නවා.

ඔය ඉක්මන් දේවල් කොටයි. ඉක්මනට කෙනෙක් හොයා ගන්න ඕනෑ කියලා මෙහෙත් ඔය කට්ටිය අම්මලා තාත්තලා 'අපේ දුව අපේ පුතා තනියෙන් ඉන්නේ, ඒක නිසා කවුරුහරි හොයලා දෙන්න ඕනෑ ඉක්මන් කරන්න ඕනෑ' කියලා ඉක්මනට එක්කෙනෙක් එක්කාසු කරගෙන එනවා. එහෙම ආවහම ඒ මනුස්සයා ඉන්නේ මාස කීපයයි. එක්කෝ ඒ මනුස්සයා ආපහු ලංකාවට යනවා. එහෙම නැත්නම් මෙහෙ divorce වෙලා වෙන එක්කෙනෙක් එක්ක යනවා. ඒවගේ දේවල් තිබෙනවා. ඒක නිසා මේ ඉක්මන් දේවල් වල තිබෙනවා හරිම අසාර්ථක unpredictable ගතියක්.

දැන් අපිට අල හොද්දක් හදාගන්න ගියහමත් ඒකට පහේ ටික දාලා ඒක තැම්බෙනකම් ඉන්න ඕනෑ. ඒක අපිට ඕන උනා කියල එහෙම කන්න බෑ. පරිප්පු උනත් තැම්බෙන්න කාලයක් යනවා. මඤ්ඤොක්කා උනත් තම්බනකොට ඒක තැම්බෙන්න කාලයක් යනවා. අපිට හදිස්සිය තිබුණා කියලා එහෙම කන්න බෑ. ඒකට තිබෙනවා වෙලාවක් කලාවක් ඒකට අවශ්‍ය කරන දේවල් දාන්න. මඤ්ඤොක්කා ටිකක් පරිප්පු ටිකක් අල බතල ටිකක් කන්න නම් ඒක හැදෙනකම් ඉන්න ඕනෑ. අපිට ඉක්මනට ඕනෑ උනා කියලා ඒ අල බතල මඤ්ඤොක්කා අපිට ඕන විදියට හැදෙන්නේ නෑ. වී ආදී දේ අපිට ඕන වෙලාවට හැදෙන්නේ නෑ. ඒවට වෙලාවක් කලාවක් තිබෙනවා.

සංස්කාර ධර්මයනුත් එහෙමයි. ඉක්මන් කොටයි. ඔය ධ්‍යානයකය උනත් ඉක්මන් උනොත් යන්නේ වෙන අහක. මාර්ග ඵල උනත් ඉක්මන් උනොත් යන්නේ වෙන අහක. හැමදේම එහෙමයි.

සමහර අය ඉක්මනට රට එන්න කියලා ඉක්මනට ඉක්මනට passport හදාගෙන එනවා. ඉක්මනට driving licence ගන්නවා කියලා මම අහලා තිබෙනවා. ඊට පස්සේ මෙහෙ ඇවිල්ලා හප්ප ගන්නවා. ඔය ඉක්මන් වැඩ වල තිබෙන ස්වභාවය. ඊළඟට අපේ එක්කෙනෙක් ඉක්මනට සනීප වෙන්න කියලා බෙහෙත් බිව්වා. එයාට තිබුණා pressure එක. ඉක්මනට සනීප වෙන්න කියලා වැඩිපුර බීලා අංසබාගේ හැදුනා. ඔයවගේ ඉක්මන් වැඩ වලට ගිහිල්ලා කෙටි කරගන්නවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ධර්ම අවබෝධයටත් එවගේද යන්න ඕන?

<u>පිළිතුර</u> - ඔව්, ධර්ම අවබෝධයත් ඒවගේ හොඳට pack වෙලා ක්‍රමානුකූලව ඉස්සරහට යන්න ඕනෑ. අපි ආපු ගමන්ම ඒක හරි යන්නේ නෑ. ඒකට පදනමක් තිබෙනවා. මූලික දේවල් එන්න ඕනෑ. මූලික දේවල් වැටෙන්න ඕනෑ. සිතක් හඳුනන්නේ නැතුව චෛතසික ධර්ම හඳුනන්නේ නැතුව නිවන කියන එක වචන මාත්‍රයෙන් හරි දැනගන්නේ නැතුව සීලය කියන්නේ මොකක්ද කියලා දන්නේ නැතුව යන්න ගියහම ගමන කොහෙද දන්නේ නෑ.

දැන් අර ගමරාලත් සිල් ගන්න ගියා කියනවනේ. ගම හාමිනේ කොච්චර අමාරුවෙන් සිල් රකිනවද කියලා එයාට තේරුණා කියලා කියන්නේ එයා සිල් ගන්න ගිය දවසෙලු. ගම හාමිනේ ගැන හරි ප්‍රසාදයක් ඇති උනාලු කොච්චර අමාරුවෙන්ද මේක රකින්නේ කියලා. එහෙම කථාවක් තිබෙනවා.

ගම හාමිනේ සිල් ගන්න යනවලු. ගමරාල යන්නේ නැතිලු. ගමරාලට කිව්වට සිල් ගන්න කියලා එයාට එච්චර ඕන කමක් නෑ. කුඹුරට යනවා හේනට යනවා. ඒවා කර කර ඉන්නවා. දවසක් ගමරාලටත් යන්න ඕන වෙලා ගිහිල්ලා තිබෙනවා සිල් ගන්න. එයා සිල් ගන්න දන්නේ නෑ. ඊට පස්සේ හාමිනේ කියලා දෙනවා. ගමරාල අහනවා 'ඉතින් පන්සල් ගිහිල්ලා මොකක්ද මම කරන්න ඕන' කියලා. එතකොට හාමිනේ කියනවා 'එහෙම අමුතු දෙයක් කරන්න නෑ. හාමුදුරුවෝ කියන එක කියන්න' කියලා.

ඊට පස්සේ මෙයා ගියා. ගියහම හාමුදුරුවෝ ඇහුවලු 'ගමරාල අද කොහෙද' කියලා. මෙයත් කිව්වලු 'ගමරාල අද කොහෙද' කියලා. හාමුදුරුවෝ 'ගමරාල අද පොයනේ' කියල කිව්වහම 'ගමරාලත් අද පොයනේ' කියල කිව්වලු. ඊට පස්සේ හාමුදුරුවෝ ඇහුවහම 'ගමරාල මොකෝ මෙහෙ' කියලා ගමරාලත් කියනවා 'ගමරාල මොකෝ මෙහෙ' කියලා. එතකොට හාමුදුරුවෝ ඇහුවලු 'ගමරාල උඹේ ඔලුව හොඳ නැත්ද' කියලා. එතකොට ගමරාලත් ඇහුවලු 'ගමරාල උඹේ ඔලුව හොඳ නැත්ද' කියලා. කියන කියන එක කියන්න කිව්වනේ. දැන් නිවන් දකින්නයි මේ වැඩේ කළේ. ඊට පස්සේ වටපිටාවේ ඉන්න මිනිස්සුත් බැලුව මෙයා හාමුදුරුවෝ කියන කියන එක කියනවා, ඊට පස්සේ ඇහුවලු 'උඹට පිස්සුද' කියලා. ඊට පස්සේ ගමරාලත් ඇහුවලු 'උඹට පිස්සුද' කියලා. ඊට පස්සේ ශාලාවේ හිටපු මිනිස්සු 'පිස්සෙක් ඇවිල්ල' කියල කිව්වලු. එතකොට ගමරාලත් කිව්වලු 'පිස්සෙක් ඇවිල්ලා' කියලා. ඊට පස්සේ ගහන්න පන්නන කොට අර ටික කියා කියාම ආවලු. ඊට පස්සේ කිව්වලු 'මට අද තමයි තේරෙන්නේ අපේ ගම හාමිනේ කොච්චර අමාරු වැඩක්ද නිවන් දකින්න කරන්නේ' කියලා. ඉතින් මේ සිල් ගන්න එක එහෙම ලේසි එකක් නෙමෙයි. ඒක ගැනත් දැනගෙන ඉන්න ඕනෑ මොකක්ද මේ කරන්නේ කියලා. එහෙම නැත්නම් එහෙම ජීවිතේ කණපිට යනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස උදේ කිව්වානේ අනුපුබ්බ සික්ඛා කියලා. සත්‍යය ඥානය, කෘත්‍යය ඥානය, කෘත ඥානය ඒ ප්‍රතිපදාවට ගලපන්න පුළුවන්ද?

<u>ස්වාමීන්වහන්සේ</u> - ඔව් පුළුවන් ප්‍රතිපදාවට ගලපන්න පුළුවන්. ඒක ගලපන්නේ චතුරාර්ය සත්‍යය අවබෝධයට.

<u>ප්‍රශ්නය</u> - එතකොට ක්‍රියා පිළිවෙල


පිළිතුර - ක්‍රියා පිළිවෙල තිබෙන්නේ ප්‍රතිපදාවේ යන මාර්ගය. අපිට අනුපූර්ව ක්‍රියා පිළිවෙතක් තිබෙන්න ඕනෑ. ශික්ෂණයක් තිබෙන්න ඕනෑ. පංච සීලය - අට සීලය - දස සීලය - සාමණේර සීලය ... දැන් කවුරු හරි මහණ වෙන්න ආවහම එක පාරම මහණ වෙලා මොනවා කරන්නද ඒ මනුස්සයා? ඒක නිසා බුදුරාජාණන් වහන්සේ මහණ වෙන්න එන එක්කෙනාට කරන්න ඕන පිළිවෙල කියලා දෙනවා. එයා දන්නේ නෑ.

'මේ විදියට වාඩිවෙන්න, මේ විදියට සිවුරු පොරවන්න, මේ විදියට කියන්න' කියලා බුදුරාජාණන් වහන්සේ මහණ කරන පිළිවෙලක් ප්‍රතිපදාවක් කියලා දෙනවා. ඒ විදියට ඕනෑ මහණ කරන්න. ඊට පස්සේ එක පාරම උපසම්පදා කරන්න බෑ. පුහුණු වෙන්න, සිවුරු පොරවන්න, දානය වළඳන්න වැනි මහණ වෙලා කරන්න තිබෙන කටයුතු ටිකක් තිබෙනවා.

දැන් කකා හිටපු අයනේ එන්නේ මහණ වෙන්න. ඒ අයට වළඳන්න පරිවර්තනය කරන්න ඕනෑ. ඇඳගෙන හිටපු ඒ අයට සිවුරු පොරවන්න උගන්නන්න ඕනෑ. ඇවිද ඇවිද හිටපු ඒ අයට වඩින්න උගන්නන්න ඕනෑ. කථා කර කර හිටපු අයට දේශනා කරන්න උගන්නන්න ඕනෑ. ඒ වගේ සම්පූර්ණ පරිවර්තනයක් වෙන්න ඕනෑ. ඉතින් ඒක පුහුණුව තිබෙන්නා වූ කෙනෙක් හික්මිච්ච කෙනෙක් එයාගේ ජීවිතියේ පරණ ගිහි ගති අයින් කරලා පරිවර්තනයක් කරන්න එයාව train කරන්න ඕනෑ. අනුපූර්ව ක්‍රමයක යන්න ඕනෑ.

හොඳයි, හැම දෙනාටම ධර්ම අවබෝධය වේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

සාධු! සාධු! සාධු!



ඉහත සඳහන් ධර්ම දේශනාව අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.